16391

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	11	විෂය / பாடம் / Subject	බුද්ධ ධර්මය	පත්‍රය / வினாத்தாள் / Paper	I, II	කාලය / காலம் / Time	පැය 03

නම්/විභාග අංකය:-.....

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

(01) සම්මා සම්බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ යහපත පිණිස ධර්ම දේශනා කළ කාලය අවුරුදු,

1. 29 කි. 2. 35 කි. 3. 45 කි. 4. 80 කි.

(02) ජීවිතයේ වැදගත් තීරණ ගැනීමේ දී සිතා විමසා බලා කටයුතු කළ යුතු බව පෙන්වා දෙන වඩාත් ගැළපෙන ආදර්ශමත් අවස්ථාවක් වන්නේ,

1. පංච මහා විලෝකනය යි.
2. මිනිස් ලොව උපත ලැබීම යි.
3. අභීත සිංහ නාද පැවැත්වීම යි.
4. සත් පියුම් මත ඇවිදීම යි.

(03) කලඳකනිවාප නම් ස්ථානයේ රෝගී ව වැඩ සිටින විට බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට දේශනා කළ ධර්මය අසා සුවපත් වූ මහ රහතන් වහන්සේ කවුරුන් ද?

1. ගිරිමානන්ද මහ රහතන් වහන්සේ
2. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
3. චුන්ද මහ රහතන් වහන්සේ
4. මුගලන් මහ රහතන් වහන්සේ

(04) බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා සිව්පස පහසුකම් ලබාගැනීම පිළිබඳ අභියෝගයට මුහුන දුන් වස් කාලය වූයේ,

1. පළමු වස් කාලය යි.
2. පස් වන වස් කාලය යි.
3. දොළොස් වන වස් කාලය යි.
4. දහනව වන වස් කාලය යි.

(05) සංග්‍රාම භූමියක සිටින ඇතෙකු දරුණු හී පහර මැඩ ගෙන ඉදිරියට යන්නා සේ බුදුරජාණන් වහන්සේ ද අට ලෝ දහමින් අකම්පිත ව කටයුතු කිරීමෙන් ප්‍රකට වන බුදු ගුණය වන්නේ,

1. පුරිසදම්මසාරථී ගුණය යි.
2. ලෝකවිදූ ගුණය යි.
3. තාදී ගුණය යි.
4. භගවා ගුණය යි.

(06) "ඔන්ති සච්චමධිට්ඨානං" යන පාලි පාඨයෙහි සඳහන් නොවන පාරමිතාව කුමක් ද?

1. ඉවසීම
2. සත්‍යය
3. අධිෂ්ඨානය
4. නෙක්ඛම්ම

SCAN AnyScanner

සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2026
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation

ශ්‍රේණිය / தரம் / Grade	විෂයය / பாடம் / Subject	පත්‍රය / வினாத்தாள் / Paper	කාලය / காலம் / Time
11	බුද්ධ ධර්මය	I, II	පැය 03

නම/විභාග අංකය:-.....

I කොටස

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයෙහි එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

(01) සම්මා සම්බුද්ධත්වයෙන් පසු බුදුරජාණන් වහන්සේ දෙව් මිනිසුන්ගේ යහපත පිණිස ධර්ම දේශනා කළ කාලය අවුරුදු,

1. 29 කි. 2. 35 කි. 3. 45 කි. 4. 80 කි.

(02) ජීවිතයේ වැදගත් තීරණ ගැනීමේ දී සිතා විමසා බලා කටයුතු කළ යුතු බව පෙන්වා දෙන වඩාත් ගැළපෙන ආදර්ශමත් අවස්ථාවක් වන්නේ,

1. පංච මහා විලෝකනය යි.
2. මිනිස් ලොව උපත ලැබීම යි.
3. අභීත සිංහ නාද පැවැත්වීම යි.
4. සත් පියුම් මත ඇවිදීම යි.

(03) කලඳකනිවාප නම් ස්ථානයේ රෝගී ව වැඩ සිටින විට බුදුරජාණන් වහන්සේ එහි වැඩම කොට දේශනා කළ ධර්මය අසා සුවපත් වූ මහ රහතන් වහන්සේ කවුරුන් ද?

1. ගිරිමානන්ද මහ රහතන් වහන්සේ
2. මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ
3. චුන්ද මහ රහතන් වහන්සේ
4. මුගලන් මහ රහතන් වහන්සේ

(04) බුදුරජාණන් වහන්සේ ඇතුළු භික්ෂූන් වහන්සේලා සිව්පස පහසුකම් ලබාගැනීම පිළිබඳ අභියෝගයට මුහුන දුන් වස් කාලය වූයේ,

1. පළමු වස් කාලය යි.
2. පස් වන වස් කාලය යි.
3. දොළොස් වන වස් කාලය යි.
4. දහනව වන වස් කාලය යි.

(05) සංග්‍රාම භූමියක සිටින ඇතෙකු දරුණු හී පහර මැඩ ගෙන ඉදිරියට යන්නා සේ බුදුරජාණන් වහන්සේ ද අට ලෝ දහමින් අකම්පිත ව කටයුතු කිරීමෙන් ප්‍රකට වන බුදු ගුණය වන්නේ,

1. පුරිසදම්මසාරථී ගුණය යි.
2. ලෝකවිදූ ගුණය යි.
3. තාදී ගුණය යි.
4. භගවා ගුණය යි.

(06) "ඛන්ති සච්චමධිට්ඨානං" යන පාලි පාඨයෙහි සඳහන් නොවන පාරමිතාව කුමක් ද?

1. ඉවසීම
2. සත්‍යය
3. අධිෂ්ඨානය
4. නෙක්ඛම්ම

SCAN AnyScanner

(07) මහත්වූ භෝග සම්පත් ලැබීම, කීර්තිය පැතිරීම, සිහිමුලා නොවී කළුරිය කිරීම යන සියලු අනුසස් ලැබෙන බව ධර්මයේ සඳහන් වන්නේ,

1. සිල් ආරක්ෂා කිරීමෙනි.
2. භාවනා කිරීමෙනි.
3. සමාජ සේවාවල් යෙදීමෙනි.
4. පිංකම් කිරීමෙනි.

(08) පොහොය දිනය, පාරමිතා ප්‍රකරණය, අභිධර්ම මාර්ගය යන ග්‍රන්ථ රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?

1. මහාචාර්ය රේරුකානේ චන්දවිමල නාහිමි විසිනි.
2. තොටගමුවේ ශ්‍රී රාහුල හිමි විසිනි.
3. හයවන පරාක්‍රමබාහු රජතුමා විසිනි.
4. විද්‍යා චක්‍රවර්ති පඬිවරයා විසිනි.

(09) සියලු කෙලෙසුන් නසා උතුම් අර්හත්වයට පැමිණ පිරිනිවන් පෑ විට පෙර කරන ලද කර්ම, විපාක දීමට අවස්ථාවක් නොලැබේ. එම කර්ම බුදු දහමේ හඳුන්වන්නේ,

1. ජනක කර්ම නමිනි.
2. අහෝසි කර්ම නමිනි.
3. ගරුක කර්ම නමිනි.
4. ආසන්න කර්ම නමිනි.

(10) කර්මයෙහි බලපෑම කොතරම් තීරණාත්මක වුව ද ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් ක්‍රියා කිරීමෙන් කර්ම විපාකවලින් මිදීම හඳුන්වන්නේ,

1. ගති සම්පත්තිය යනුවෙනි.
2. උපධි සම්පත්තිය යනුවෙනි.
3. කාල සම්පත්තිය යනුවෙනි.
4. පයෝග සම්පත්තිය යනුවෙනි.

(11) වට්ටගාමිණී අභය රජතුමා විසින් අභයගිරිය විහාරය කරවා පූජා කළේ, තමන් වනගත ව සැඟවී සිටි සමයේ උපකාර කළ,

1. මහා විහාරයීය භික්ෂූන් වහන්සේලාට ය.
2. මිහිඳු මහ රහතන් වහන්සේට ය.
3. කුපික්කල මහා තිස්ස හිමියන්ට ය.
4. වසුමිත්‍ර හා පාර්ශ්ව හිමිවරුන්ට ය.

(12) බුද්ධකාලීන භාරතයෙහි ප්‍රචලිත ව පැවති ආගමික පිළිගැනීම් එකකට හෝ නොවැටෙන, දුක්ඛ නිරෝධගාමිණී ප්‍රතිපදාව, ශික්ෂා තුනකින් සහ,

1. මාර්ගාංග හතරකින් සමන්විත ය.
2. මාර්ගාංග අටකින් සමන්විත ය.
3. මාර්ගාංග දොළහකින් සමන්විත ය.
4. මාර්ගාංග විසිහතරකින් සමන්විත ය.

(13) ශීලාදී ගුණධර්මයන් නොපුරා තරුණයෙකු ලෙස තම හැකියාව යොදවා ධනය උපයා ගැනීමක් ද නොකර, කෙළිදෙලෙන් ජීවත් වන්නන් ධම්ම පදයෙහි උපමා කර ඇත්තේ,

1. මහලු කොස්වා ළිහිණියාට ය.
2. රසයක් නොදැනෙන හැන්දට ය.
3. ගොනු පසුපස එන කරත්ත රෝදයට ය.
4. වනයේ වැටී දිරාපත් වන ඊතලයට ය.

(14) සියලු අවුල් නිරවුල් කරගෙන සසර දුකින් මිදිය හැකි බව බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. මෙහි 'අවුල්' යන්නෙන් අර්ථ දක්වා ඇත්තේ,

1. සසර දුක් ය.
2. දුප්පත්කම ය.
3. පාප කර්මයන් ය.
4. වැරදි ජීවන රටාව ය.

(15) යම් ශිෂ්‍යයෙකු නිතර නිදිමත ගතියෙන්, උදාසීන ගතියෙන් කටයුතු කරයි නම් පාඩම් කළ දේ හා ඉගෙන ගත් දේ මතකයට නොඑයි. මෙම ස්වභාවය නීවරණ ධර්මවල සඳහන් වන්නේ,

1. කාමච්ඡන්ද යනුවෙනි.
2. ව්‍යාපාද යනුවෙනි.
3. ථීනමිද්ධ යනුවෙනි.
4. විචිකිච්ඡා යනුවෙනි.

(16) පරමාර්ථ වශයෙන් ලෝකයේ යථා ස්වභාවය ඒ හැටියෙන් ම අවබෝධ කළ හැකි භාවනා ප්‍රභේදය වන්නේ,

1. ආනාපානසති භාවනාව යි.
2. විපස්සනා භාවනාව යි.
3. බුද්ධානුස්සති භාවනාව යි.
4. සමාධි භාවනාව යි.

(17) දස අකුසල කර්මයන් අතර මනෝ කම්ම අකුසල කර්මයන්ට අයත් නොවන කර්මයක් වන්නේ,

1. අභිධ්‍යාව යි.
2. ව්‍යාපාදය යි.
3. මිත්‍යා දෘෂ්ටිය යි.
4. අදත්තාදානය යි.

(18) බෞද්ධයන්ගේ ස්වභාවය නම් ජාතිය ආගම කුමක් වුව ද, යම් පුද්ගලයෙකුගේ කරදරයක දී කම්පනයට පත් වීමයි; අනුකම්පා කිරීමයි; දයාව දැක්වීමයි. සිව් බඹ විහරණ ධර්මයන්ට අනුව මෙම ස්වභාවය හඳුන්වන්නේ,

1. මෙත්තා යනුවෙනි.
2. කරුණා යනුවෙනි.
3. මුදිතා යනුවෙනි.
4. උපෙක්ඛා යනුවෙනි.

(19) මානසික රෝග සුව කර ගැනීමට නම් මනස සංවර කර ගත යුතු යැයි ධම්ම පදයේ සඳහන් වේ. එම අදහස දෙන ගාථාවේ ආරම්භක පද පෙළිය කුමක් ද?

1. පරිඵන්දතිදං චිත්තං
2. වාරිජෝව ථලේ ඛිත්තෝ
3. ඕකමෝකත උබ්හතෝ
4. මාරධෙය්‍යං පහාතවේ

(20) සමාජයේ ඇතැම් මිනිසුන් මධ්‍යම වර්ධනය සහිත පෞරුෂ ඇත්තෝ ය. මෙවැනි පුද්ගලයන් ධර්මයේ උපමා කර ඇත්තේ,

1. මඩ ජලය හා සමව ඇති නෙළුම් පොහොට්ටුවලට ය.
2. මඩෙහි ගැලී තිබෙන නෙළුම් පොහොට්ටුවලට ය.
3. මඩෙහි නොගෑවී තිබෙන නෙළුම් පොහොට්ටුවලට ය.
4. නොපිපුණු නෙළුම් පොහොට්ටුවලට ය.

(21) කාලාම සූත්‍රයේ එන ඉගැන්වීම් අනුව යම් කරුණක් පිළිගත යුත්තේ,

1. පරම්පරාගත ව පිළිගෙන ඇත්නම් පමණි.
2. කුසල් බව ප්‍රත්‍යක්ෂ වන්නේ නම් පමණි.
3. තර්කයට ගැළපෙන්නේ නම් පමණි.
4. පොතපතේ සඳහන් වන්නේ නම් පමණි.

(22) බෞද්ධ සාහිත්‍යයට අනුව බුදුරජාණන් වහන්සේ තම මංගල ධර්ම දේශනාව පවත්වා ඇත්තේ,

1. රජගහනුවර වේළුවනාරාමයේ දී ය.
2. සැවැත්නුවර ජේතවනාරාමයේ දී ය.
3. ඉසිපතන මිගදායේ දී ය.
4. සප්තපර්ණී ගල්ගුහාව ඉදිරිපිට දී ය.

(23) එක්තරා දෙවියෙකු විසින් බුදුරජාණන් වහන්සේගෙන් අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු ලෙස දේශනා කළ පරාභව සූත්‍රයේ අන්තර්ගත දේශනාව වන්නේ,

1. ශ්‍රද්ධාව පිළිබඳව ය.
2. යුතුකම් ඉටුකිරීම පිළිබඳව ය.
3. දෙලොව දියුණුවට හේතුවන කරුණු ය.
4. පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු ය.

(24) සංඝමිත්තා රහත් තෙරණියගේ ආගමනයෙන් මෙරට ආරම්භ වූ භික්ෂුණී ශාසනයේ පළමුවෙන් ම පැවිදි වූ කාන්තාව කවුරුන් ද?

1. අනුලා බිසව
2. සුගලා දේවිය
3. විහාරමහා දේවිය
4. ලීලාවතී රැජින

(25) "හැම කල්හි ම මනා සිහියෙන් යුතු ව පමණ දැන ආහාර ගැනීමෙන් දුක් වේදනාවන් තුනී වේ. ආහාර සෙමින් දිරයි. ආයුෂ වැඩෙයි" පසේනදී කොසොල් රජතුමාට දුන් මෙම උපදෙස් සඳහන් වන්නේ,

1. පත්තකම්ම සූත්‍රයේ ය.
2. දෝණපාක සූත්‍රයේ ය.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ ය.
4. චක්කවත්ති සීහනාද සූත්‍රයේ ය.

SCAN AnyScanner

(26) සිගාලෝවාද සූත්‍රයෙහි සඳහන් බිරිඳ විසින් සැමියාට ඉටුකළ යුතු යුතුකමක් නොවන්නේ,

1. ඇසුරු කරන පිරිසට මැනවින් සංග්‍රහ කිරීම යි.
2. උපයන ලද ධනය ආරක්ෂා කිරීම යි.
3. පරදාර සේවනයේ නොයෙදීම යි.
4. ගෙදර කටයුතු මැනවින් සංවිධානය කිරීම යි.

(27) හේතුඵල දහමට අනුව දුප්පත් අයට ධනය නොදීමෙන් දිළිඳුකම ද, දිළිඳුකම නිසා සොරකම් ද, සොරකම නිසා අවි ආයුධ ද වැඩි විය. අවි ආයුධ වැඩි වීමෙන් සිදු වන්නේ,

1. සිර ගෙවල් වැඩි වීම යි.
2. සොරුන් වැඩි වීම යි.
3. අවි ආයුධ වෙළඳාම සරුවීම යි.
4. ජීවිත හානි වැඩි වීම යි.

(28) පළමු ධර්ම සංගායනාවේ දී ඇති කරගත් සම්මුතිය අනුව ශික්ෂාපද ලිහිල් නොකර ඉදිරියට පවත්වා ගෙන යාම සම්මත වූයේ,

1. දෙවන ධර්ම සංගායනාවේ දී ය.
2. තෙවන ධර්ම සංගායනාවේ දී ය.
3. අලුවිහාර ධර්ම සංගායනාවේ දී ය.
4. කණිෂ්ක ධර්ම සංගායනාවේ දී ය.

(29) අනුරාධපුර යුගයේ රචිත සිඛවළඳ හා සිඛවළඳවිනිස යන කෘතිය රචනා කිරීමේ අරමුණ වූයේ,

1. ග්‍රන්ථකරණයේ යෙදන අයට උපදෙස් දීම ය.
2. භික්ෂූන් වහන්සේලාගේ පරිශීලනයට යෙදවීම ය.
3. මහින්දාගමනය පිළිබඳ ව විස්තර කිරීම ය.
4. බුදුගුණ වර්ණනා කිරීම ය.

(30) 'සිල්වත්, ගුණවත්, වියත් මහණ බමුණන්ගෙන් අවවාද අනුශාසනා ලබා ගනිමින් රට පාලනය කරන්න' යනුවෙන් සඳහන් වන්නේ,

1. සප්ත අපරිහානීය ධර්මවල ය.
2. සතර අගතිවල ය.
3. දසරාජ ධර්මවල ය.
4. දස සක්විතිවත්වල ය.

(31) ගසාකෑමෙහි සමත්, සාර ධර්ම මග හැර යන, කිලිටි දිවි පැවැතුම් ඇති පුද්ගලයන් බුදු දහමෙහි උපමා කර ඇත්තේ,

1. සූර කපුටන්ට ය.
2. කපටි හිවලුන්ට ය.
3. විෂඝෝර නාගයින්ට ය.
4. කෑදර ගිජුලිහිණියන්ට ය.

(32) නොකළ යුතු වෙළඳාමෙන් වැළකී, හොර කිරුම්-මිනුම්, වැරදි මුදල් භාවිතයෙන් වැළකී දැහැමි ජීවන වෘත්තියක නියැලී ජීවත් වීම,

1. සම්මා සංකප්ප නම් වේ.
2. සම්මා කම්මන්ත නම් වේ.
3. සම්මා ආජීව නම් වේ.
4. සම්මා වායාම නම් වේ.

(33) ඕල්කට් තුමා සමග එක්ව අනගාරික ධර්මපාලතුමා මිෂනාරීන්ගේ නොමනා අධ්‍යාපනය වෙනුවට ශ්‍රී ලංකාවේ,

1. මහා විද්‍යාල ආරම්භ කළහ.
2. ඉරිදා පාසල් ආරම්භ කළහ.
3. පළාත් සභා පාසල් ආරම්භ කළහ.
4. ජාතික පාසල් ආරම්භ කළහ.

(34) දස පුණ්‍ය ක්‍රියාවක්, ආර්ය ධනයක්, රාජ ධර්මයක්, පාරමිතාවක්, ගිහි පැවිදි සැමට සැපයක්, සියලු සුවඳ ඉක්මවා යන සුවඳක් වශයෙන් බුදු දහමේ උගන්වන්නේ,

1. දානය යි.
2. සීලය යි.
3. භාවනාව යි.
4. තපස යි.

SCAN AnyScanner

(35) පංචස්කන්ධය ම පිනවමින් භෞතික සැපයෙහි පමණක් ගිජු ව ජීවත් ව මිය ගිය විට එම තැනැත්තා බහුරූ කෝළමක් පෙන්වා ගියාක් වැනි යැයි සඳහන් වන්නේ,

1. ලෝකෝපකාරය කෘතියේ ය.
2. සද්ධර්මරත්නාවලිය කෘතියේ ය.
3. සුභාෂිතය කෘතියේ ය.
4. ලෝවැඩ සඟරාව කෘතියේ ය.

(36) "ලෝභී පුද්ගලයාගේ ලෝභකම ඔහුට බොහෝ කලක් අවැඩ පිණිස ම දුක් පිණිස ම වේ. ඔහු සතුන් මරයි, සොරකම් කරයි, පරදාර සේවනයේ යෙදෙයි, බොරු කියයි, අනුන් ද ඒවාට පොළඹවයි." බුදුරජාණන් වහන්සේ මෙසේ දේශනා කළේ,

1. කාලාම වැසියන්ට ය.
2. ශාක්‍ය වැසියන්ට ය.
3. කෝලිය වැසියන්ට ය.
4. භික්ෂූන් වහන්සේලාට ය.

(37) සැප දුක දෙකෙහි දී ම තමා හා අනුන් සමාන ලෙස සලකා ක්‍රියා කිරීමේ ගුණය බුදු දහමට අනුව,

1. සමජීවිකතාව යි.
2. සංහිඳියාව යි.
3. සමානාත්මතාව යි.
4. සහජීවනය යි.

(38) යමෙක් කුසල් අකුසල් මොනවා දැයි, සත්‍ය අසත්‍ය කුමක් දැයි ආදි වශයෙන් ධර්මානුකූල ව විමසමින් ධාර්මික ව ජීවත්ව මිය ගොස් නැවත උපදින විට,

1. යසස් ඇති ව උපදියි.
2. ප්‍රඥාවන්ත ව උපදියි.
3. මහේශාක්‍ය ව උපදියි.
4. මහා භෝගී ව උපදියි.

(39) යම් පාලකයෙකුට හොඳ නරක හෝ යුක්තිය අයුක්තිය තෝරා ගැනීමට නොහැකි වන්නේ නම් ඔහු සතර අගතිවල,

1. ඡන්දයෙන් අගතියට ගිය පාලකයෙකි.
2. ද්වේශයෙන් අගතියට ගිය පාලකයෙකි.
3. මෝහයෙන් අගතියට ගිය පාලකයෙකි.
4. භයෙන් අගතියට ගිය පාලකයෙකි.

(40) සැපවත් හා තෘප්තිමත් ජීවිතයක් ගත කිරීම සඳහා පුද්ගලයෙකුට තිබිය යුතු උතුම් ම ලාභය වන්නේ,

1. මිල මුදල් ය.
2. පිරිස් බලය ය.
3. වස්තු සම්පත් ය.
4. නිරෝගීකම ය.

(ලකුණු 1 × 40 = 40)

16387

SCAN AnyScanner

All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම 2026
ஆண்டிறுதி மதிப்பீடு
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	බුද්ධ ධර්මය	පත්‍රය வினாத்தாள் Paper	II	කාලය காலம் Time

II කොටස

සැලකිය යුතුයි:
- පළමු ප්‍රශ්නය හා නවන් ප්‍රශ්න හතරක් ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමුව ප්‍රශ්නයට ලකුණු 20ක් ද නෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමි වේ.

(01) (i) බුදුරජාණන් වහන්සේට ප්‍රශංසා කළ සමකාලීන ආගමික නායකයින් දෙදෙනෙක් නම් කරන්න.

(ii) ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් රෝග වැළඳීමට බලපාන හේතු දෙකක් ලියන්න.

(iii) 'අත්තූපනායික ධර්මපරියාය' යනු කුමක්දැයි හඳුන්වන්න.

(iv) දුටුගැමුණු රජතුමාගේ ආගමික සේවාවන් දෙකක් ලියන්න.

(v) නිර්වාණගාමී ප්‍රතිපදාවෙහි ගමන් කරන්නෙකු විසින් අත්හළ යුතු අන්ත දෙක මොනවා ද?

(vi) මහනුවර යුගයේ බෞද්ධ සිතුවම් දක්නට ලැබෙන විහාරස්ථාන දෙකක් නම් කරන්න.

(vii) බුදුරජාණන් වහන්සේ ස්වාභාවික පරිසරය දම්සභා මණ්ඩපයක් බවට පත්කර ගත් අවස්ථා දෙකක් සඳහන් කරන්න.

(viii) "හේතුං පටිච්ච සම්භූතං - හේතු භංගා නිරුජ්ඣති" යන පාලි පාඨයෙහි තේරුම ලියන්න.

(ix) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ සඳහන් ධනය විනාශ වන ක්‍රම දෙකක් ලියන්න.

(x) ආහාර පරිභෝජනය හා බැඳුණු සේඛියා ධර්ම දෙකක් ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(02) (i) "උට්ඨානවතෝ සතිමතෝ ...." යන ධම්මපද ගාථාව සම්පූර්ණ කර ලියන්න.

(ii) එම ගාථාවේ සඳහන් පුද්ගලයෙකුගේ යසස් වර්ධනයට බලපාන කරුණු තුනක් ලියන්න.

(iii) ඉහත (ii) හි ඔබ ලියූ කරුණු යහපත් ජීවන රටාවක් ගොඩ නගා ගැනීමට ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න.

(ලකුණු 2 + 3 +5 = 10)

(03) (i) ධර්ම සංගායනාවක් යනු කුමක් දැයි හඳුන්වන්න.

(ii) දෙවන ධර්ම සංගායනාව පැවැත් වූ ස්ථානය, ගත වූ කාලය හා එම සංගායනාවට අනුග්‍රහය දැක්වූ රජතුමා පිළිවෙළින් ලියන්න.

(iii) දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල ශාසනයේ උන්නතිය වෙනුවෙන් බල පෑ ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.

(ලකුණු 2 + 3 +5 = 10)

SCAN AnyScanner

(04) (i) භාවනාව යනු කුමක් දැයි හඳුන්වන්න.

(ii) භාවනාවට යොමු වන පුද්ගලයෙකු ඉටුකර ගත යුතු පූර්ව අවශ්‍යතා **තුනක්** ලියන්න.

(iii) සමථ භාවනාව ශිෂ්‍ය ජීවිතයට වැදගත් වන අයුරු **විස්තර** කරන්න.

(ලකුණු 2 + 3 +5 = 10)

(05) (i) 'ස්තූපය' යන්නට සමානාර්ථ පද **දෙකක්** ලියන්න.

(ii) ස්තූපාංග **තුනක්** නම් කරන්න.

(iii) ලාංකේය ස්තූප කලාවේ විශිෂ්ටත්වය **පිළිබඳ සාකච්ඡා** කරන්න.

(ලකුණු 2 + 3 +5 = 10)

(06) (i) පන්නකම්ම සූත්‍රයේ සඳහන් බලි **සංකල්ප (පංච බලි) දෙකක්** ලියන්න.

(ii) දීඝජානු කෝලීය පුත්‍රයාට දේශනා කළ මෙලොව දියුණුවට හේතුවන කරුණු **තුනක්** ලියන්න.

(iii) ගෘහ ජීවිතයේ දියුණුවට ඉවහල් වන **චතුර්විධ සුඛයන්** විස්තර කරන්න.

(ලකුණු 2 + 3 +5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් **දෙකකට** කෙටි සටහන් ලියන්න.

(i) වැලිවිට සරණංකර සංඝරාජ නාහිමි

(ii) දාන පාරමිතාව

(iii) අනිත්‍ය ලක්ෂණය

(iv) ප්‍රතිමාඝර

(ලකුණු 5 +5 = 10)

SCAN AnyScanner

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
මේල් මාකාණෙක් කල්විත් තිණෙක්කළම්
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2026
Year End Evaluation

ශ්‍රේණිය தரம் Grade	11	විෂයය பாடம் Subject	බුද්ධ ධර්මය	පත්‍රය வினாத்தாள் Paper		කාලය காலம் Time	3.00

පිළිතුරු පත්‍රය

01 - 3	11 - 3	21 - 2	31 - 1
02 - 1	12 - 2	22 - 3	32 - 3
03 - 4	13 - 4	23 - 4	33 - 2
04 - 3	14 - 1	24 - 1	34 - 2
05 - 3	15 - 3	25 - 2	35 - 4
06 - 4	16 - 2	26 - 3	36 - 1
07 - 1	17 - 4	27 - 4	37 - 3
08 - 1	18 - 2	28 - 1	38 - 2
09 - 2	19 - 2	29 - 2	39 - 3
10 - 4	20 - 1	30 - 4	40 - 4

(ලකුණු 40 යි)

2 කොටස

01.

I. සෝණදණ්ඩ බමුණා, පොට්ඨපාද පරිබ්‍රාජකයා, චංකි බමුණා

II. 1. ශරීරගත පිත් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග.
2. සෙම් ධාතුව කිපීමෙන් වැළඳෙන රෝග.
3. වාතය කිපීමෙන් වැළඳෙන රෝග.
4. වා, පිත්, සෙම් යන තුන් දොස් කිපීමෙන් හටගන්නා රෝග.
5. සෘතු විපර්යාස නිසා වැළඳෙන රෝග.
6. වැරැදි කායික ක්‍රියාකාරකම්වලින් හටගන්නා රෝග.
7. අනුන්ගේ උපක්‍රම නිසා හටගන්නා රෝග.
8. කර්ම විපාක අනුව හටගන්නා රෝග.

මෙම හේතුවලින් ඕනෑම දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

III. තමන් උපමා කොටගෙන වරදින් මිදීම අත්තූපනායික ධර්මයයි.

IV රුවන්මැලි මහා සෑය ඉදිකිරීම, මිරිසවැටිය දාගැබ ඉදිකිරීම, ලෝවාමහා ප්‍රාසාදය ඉදිකිරීම, මහා විහාරය අංගසම්පූර්ණ ලෙස විවිධ ගොඩනැගිලිවලින් යුත් දැකුම්කලු සුවිසල් බෞද්ධ මධ්‍යස්ථායක් බවට පත් කිරීම, වසරක් පාසා වෙසක් උත්සවය පැවැත් වීම, රටපුරා ධර්ම දේශනා පිංකම් පවත්වා දේශකයන් වහන්සේලාට ධර්ම පූජා සිදු කරවීම ආදිය.

V අත්තකිලමථානු යෝග ප්‍රතිපදාව සහ කාමසුඛල්ලිකානු යෝග ප්‍රතිපදාව.

VI . දෙගල් දොරුව විහාරය, මැදවල විහාරය, රන්ගිරි දඹුළු විහාරය, කුරුණෑගල රීදී විහාරය, බඹරගල විහාරය, කැලණිය පැරැණි විහාර මන්දිරය. ආදි ස්ථාන

Past Papers Wiki

VII. 1. පළමු ධර්ම දේශනාව ඉසිපතන මිගදායෙ දී දේශනා කිරීම
2. වේදනා පරිග්‍රහ සූත්‍රය ගිජ්ඣකූට පර්වතයේ සූකරකත්ත ලෙනෙහි දී දේශනා කිරීම
3. අම්බට්ඨ සූත්‍රය ඉච්ඡානංගල වනයේ දී දේශනා කිරීම
4. තේවිජ්ජ සූත්‍රය අචිරවතී ගං ඉවුරෙහි පිහිටි අඹ වනයක දී දේශනා කිරීම
5. මහා සීහනාද සූත්‍රය විශාලා මහනුවර වන පියසක දී දේශනා කිරීම
6. මහා මොග්ගලාන සූත්‍රය කලන්දක නිවාප නම් ස්ථානයේ දී කිරීම
7. සිංසපා සූත්‍රය ඇට්ටේරියා වනයක දී දේශනා කිරීම
8. සෝණදණ්ඩ සූත්‍රය චම්පා නුවර ගග්ගරා පොකුණ අසල දී දේශනා කිරීම
9. සාමඤ්ඤඵල සූත්‍රය ජීවක අඹ උයනේ දී දේශනා කිරීම
10. ධනීය ගෝපාල සූත්‍රය මහී ගංගා තීරයේ දී දේශනා කිරීම
11. කසී භාරද්වාජ සූත්‍රය කෙත් යායක දී දේශනා කිරීම
ධර්ම දේශනා කළ ස්ථාන පමණක් ලියා තිබීම ප්‍රමාණවත් ය.
මීට අමර ව දරුවන් තවත් ස්ථාන දක්වා ඇත්නම් නිවැරැදි බව තහවුරු කර ගෙන ලකුණු දෙන්න.

VIII. හේතු නැතිවන විට ඒ හේතු නිසා හටගත් දේද නැතිව යයි.

IX. 1. රජයට අයත් වීම
2. සොරුන් විසින් පැහැර ගනු ලැබීම
3. ගින්නෙන් හෝ ජලයෙන් විනාශයට පත් වීම
4. තමා ප්‍රිය නොකරන අයට අයත් වීම

X 1. ආහාර ළං කිරීමට කලින් ම මුඛය විවෘත කිරීම
2. ආහාර ගන්නා විට අත්ල මුඛයට ඇතුළු කිරීම
3. ආහාර මුඛයෙහි තිබිය දී කථා කිරීම
4. මුඛය විවෘත කොට ආහාර ඒ තුළට විසි කිරීම
5. බත් පිඬ කටින් කඩ කඩා අනුභව කිරීම
6. අතගසා දමමින් ආහාර ගැනීම
7. දිව මුවින් පිටතට ඇද ආහාර ලැනීම
8. සුරු සුරු හඬ නගමින් ආහාර ගැනීම
9. අත ලෙකමින් ආහාර ගැනීම
10. තොල් ලෙවකමින් ආහාර ගැනීම
11. ඉඳුල් සහිත අතින් පැන් බඳුන ඇල්ලීම
12. වඳුරන් මෙන් ආහාර හක්කේ තබාගෙන ආහාර අනුභව

(ලකුණු 2×10=20)

02. I. උට්ඨානවතෝ සතිමතෝ - සුචිකම්මස්ස නිසම්මකාරිනෝ
සඤ්ඤතස්සව ධම්ම ජීවිනෝ - අප්පමත්තස්ස යශෝභි වඩ්ඪති

II. උත්සාහය, යහපත් සිහි කල්පනාව, තිදොරින් යහපත් දේ කිරීම, දොස් නිදොස් සොයා බලා නිවැරැදි දේ කිරීම, හික්මීම, දැහැමි ව ජීවත් වීම, අප්‍රමාද බව

III. ඉහත ගාථාව ඇසුරු කර ගනිමින් දෙවන ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරු උපුටා දක්වමින් යහපත් ජීවිතයක් ගොඩ නගා ගැනීමට එම කරුණු ඉවහල්වන අයුරු ප්‍රමාණවත් ව ලියා ඇත්නම් ලකුණු පිරිනමන්න.

(ලකුණු 2+3+5=10)

PAST PAPERS WIKI

03. I. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මය හා පනවන ලද විනය භික්ෂූන් වහන්සේලා එක් වී සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ. (10 ශ්‍රේණිය) හෝ, ධර්මධර විනයධර මහ තෙරුන් වහන්සේලා රැස් ව ශාසන අභිවෘද්ධිය අපේක්ෂාවෙන් බුද්ධ වචනය ඒකරාශී කොට සජ්ඣායනා කිරීම ධර්ම සංගායනා නම් වේ. (11 ශ්‍රේණිය) මේ නිර්වචන දෙකම සමාන අදහස් වේ.

II. පැවැත් වූ ස්ථානය - විශාලා මහනුවර වාළුකාරාමය
ගත වූ කාලය - මාස 09යි
අනුග්‍රහය දැක් වූ රජතුමා - කාලාශෝක රජතුමා

III. වජ්ජිපුත්තක භික්ෂූන් ගේ අකැප දසවස්තුව විනය විරෝධි බැව් තීරණය කොට එම පිළිගැනීම් ප්‍රතික්ෂේප කිරීම ද,
එම පිළිගැනීම ඇති භික්ෂූන් සසුනෙන් නෙරපා හැරීම ද,
නිර්මල ධර්ම විනය පිළිගත් භික්ෂූන් එක් ව ථේරවාද සම්ප්‍රදායක් ලෙස නැවැත සංවිධානය වීම යනා දී දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල මේ දක්වා බුද්ධ ශාසනය ආරක්ෂා වීමට බලපෑ ආකාරය විස්තර කරමින් ලියා ඇති පිළිතුරකට ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(ලකුණු 2+3+5=10)

04. I. සිතේ කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

II. කල්‍යාණ මිත්‍ර ඇසුර, සිල්වත් බව, ධර්ම ශ්‍රවනය, වීර්යය, ප්‍රඥාව

III. සමථ භාවනාවේ ප්‍රයෝජන දක්වමින් එම ප්‍රයෝජන ශිෂ්‍ය ජීවිතයට වැදගත්වන අයුරු විස්තර කරමින් ප්‍රශ්නයට ගැලපෙන අයුරින් ප්‍රමාණවත් පිළිතුරක් ලියා ඇත්නම් ලකුණු දෙන්න.

(ලකුණු 2+3+5=10)

05. I. සෑය, දාගැබ, වෙහෙර, වෙහෙර වහන්සේ, චෛත්‍යය.

II. තුන් මහල් පේසාව, ගර්භය, හතරැස් කොටුව, දේවතා කොටුව, කොත් කැරැල්ල, කොත, චූඩාමාණික්‍යය

III. ලාංකේය ස්තූප කලාවේ විශිෂ්ඨත්වය නිදර්ශන ද ඇතුළත් කරමින් ලියා ඇත්නම් ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(ලකුණු 2+3+5=10)

06. I. අථීති බලි, ඤාති බලි, පුබ්බපේත බලි, දේවතා බලි, රාජ බලි

II. උට්ඨාන සම්පදා, ආරක්ඛ සම්පදා, කල්‍යාණ මිත්තතා, සමජීවිකතා

III. අත්ථි සුඛ, භෝග සුඛ, අණන සුඛ, අනවජ්ජ සුඛ යන චතුර්විධ සැපයන් උපුටා දක්වමින් එම කරුණු ගෘහ ජීවිතයේ දියුණුවට ඉවහල් වන අයුරු විස්තර කරමින් ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(ලකුණු 2+3+5=10)

07. මාතෘකා දෙකකට අදාළව ලියා ඇති පිළිතුරු වලට අනුව ප්‍රමාණවත් ලකුණු දෙන්න.

(ලකුණු 5+5=10)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library